# සන්නිවේදන

## ශාස්ත්‍රීය සංග්‍රහය තෙවන වෙළුම 2013

40th Anniversary
1973
2013
Department of Mass Communication
University of Kelaniya- Sri Lanka

ජනසන්නිවේදන අධ්‍යයන අංශයේ

**සිව් දශක සැමරුම් කලාපය**




මහාචාර්ය විමල් දිසානායක
*ඊස්ට්-වෙස්ට් මධ්‍යස්ථානය,*
*හවායි විශ්වවිද්‍යාලය.*
*ඇමරිකා එක්සත් ජනපදය.*


# සන්නිවේදනය: හබර්මාස්ගේ චින්තන මාර්ගය

කැලණිය විශ්වවිද්‍යාලයෙහි ජනසන්නිවේදන අධ්‍යයන අංශයට සතළිස් වසරක් පිරීම වැදගත් සංසිද්ධියකි. මෙම දශක සතර ඇතුළත ශ්‍රී ලංකාවෙහි ඥාන ක්ෂේත්‍රයෙහි ප්‍රවර්ධනය සඳහා මෙම අධ්‍යයන අංශයෙන් විශාල මෙහෙයක් ඉටු විය. නව ශාස්ත්‍රීය සංකල්ප ගෙනහැර දැක්වීම ඝ නව චින්තන රටා හඳුන්වාදීම, නව වින්දන පථ විවෘත කිරීම, සන්නිවේදන කාර්යයන් පිළිබඳ විචාරාත්මක දෘෂ්ටියක් පතළ කිරීම එම මෙහෙයන් අතර වැදගත් තැනක් හිමි කොට ගෙන ඇති බව කිව මනාය. එබැවින් කැලණිය විශ්වවිද්‍යාලයෙහි ජනසන්නිවේදන අධ්‍යයන අංශය පිහිටුවා සතළිස් වසරක් ඉකුත්වීම අනුස්මරණය කරන මෙම අවස්ථාවේදී ජනසන්නිවේදන ක්ෂේත්‍රය නව දෘෂ්ටි කෝණයකින් අවලෝකනය කිරීමට විද්‍යාර්ථීන් හා බුද්ධිමත් පාඨකයන් පෙළඹවූ විශිෂ්ට දාර්ශනිකයෙකුගේ චින්තන මාර්ගයක් කෙරෙහි ආලෝක ධාරාවක් යොමු කිරීම මැනවැයි සිතමි.

එම ශ්‍රේෂ්ඨ චින්තකයා නම් ජර්ගන් හබර්මාස්ය. ඔහු ජර්මන් ජාතික දාර්ශනිකයෙකි. ඔහු සිය ශාස්ත්‍රීය ග්‍රන්ථ හා නිබන්ධ රචනා කළේ ජර්මන් භාෂාවෙනි. ඒවා බොහෝමයක්ම ඉංග්‍රීසි භාෂාවට පරිවර්තිතව ඇත. මෙම සෑම කෘතියක්ම මම අධ්‍යයනය කළෙමි. එමතුද නොව හවායි විශ්වවිද්‍යාලයෙහි පශ්චාත් උපාධිධාරී ශිෂ්‍යයන් සඳහා හබර්මාස් පඬිවරයාගේ ශාස්ත්‍රීය ලේඛන පිළිබඳ දේශන මාලාවක් වාර්ෂිකව ඉදිරිපත් කළෙමි. මීට වර්ෂ දශකයකට පමණ ඉහත දී ජර්ගන් හබර්මාස් මහාචාර්යතුමා දේශනයක් සඳහා හොං කොං නගරයට පැමිණි අවස්ථාවේ දී ඔහු සමඟ කතාබස් කොට ඇතැම් ගැටලු නිරාකරණය කර ගැනීමට ද මට අවස්ථාවක් ලැබිණි.

ජර්ගන් හබර්මාස් මහාචාර්යතුමා ලෝකයෙහි වෙසෙන අග්‍රගණ්‍ය දාර්ශනිකයෙකි. සමාජ චින්තකයෙකි. ඔහු ජර්මනියෙහි ජීවත්වන ශ්‍රේෂ්ඨතම දාර්ශනිකයා ලෙස සලකනු ලැබේ. මෙම දේශනයෙහි අරමුණ හබර්මාස් සූරීන්ගේ සන්නිවේදන චින්තනය ලුහුඬින් පැහැදිලි කිරීමයි. බොහෝ දාර්ශනිකයන්ගේ ලිපි ලේඛනවල සන්නිවේදන සංකල්ප ගැබ්ව ඇත. උදාහරණයක් වශයෙන් බටහිර දර්ශන සම්ප්‍රදාය හා සම්බන්ධ ආදි කර්තෘවරයෙකු ලෙස සැලකිය හැකි විශිෂ්ට චින්තකයෙකු වන ඇරිස්ටෝටල් පඬිතුමාගේ නොයෙක් නිබන්ධවල සන්නිවේදන ගවේෂණයට අදාළ විවිධ සංකල්ප අන්තර්ගත ව තිබේ. මෙම ලක්ෂණය ප්ලේටෝ, කාන්ට්, නිට්ෂේ, හයිඩෙගර්, හියුම් වැනි දාර්ශනිකයන්ගේ ලිපි ලේඛනවල ද දක්නට ලැබේ. එහෙත් ජර්ගන් හබර්මාස් සූරීන්ගේ චින්තනයෙහි එක් විශේෂත්වයක් ඇත. එනම් සන්නිවේදනය එහි මුඛ්‍යතම සංකල්පය වීමයි. ඔහුගේ චින්තන රටාව හසුරුවන මධ්‍යම බලවේගය සන්නිවේදන ක්‍රියාවන්හි තථ්‍ය ස්වරූපය අවබෝධ කර ගැනීමේ අභිලාෂයයි. එබැවින් සන්නිවේදන විද්‍යාව පිළිබඳ ඇල්මක් දක්වන ශාස්ත්‍රාභිලාෂීන් හබර්මාස් පඬිතුමාගේ ශාස්ත්‍රීය නිබන්ධ ලැදිව ප්‍රගුණ කළ යුතුය.

මා විසින් මීට ඉහත දී සඳහන් කරන ලද පරිදි ජර්ගන් හබර්මාස් මහතා සිය ලිපි ලේඛන සම්පාදනය කළේ ස්වකීය මාතෘ භාෂාව වන ජර්මන් භාෂාවෙනි. ඔහුගේ කෘති අතිශයින් සංකීර්ණය. ඔහුගේ රචනා ශෛලිය බොහෝ විට දුර්බෝධය. ඔහුගේ විශ්ලේෂණයන්ට මුල් වී ඇත්තේ ඉතා ගැටමුසු චින්තන රටා නිසා ඔහුගේ කෘතිවල දුර්බෝධත්වය තව දුරටත් ඝන වී ඇත. හබර්මාස් විද්වතාණන්ගේ ලිපි ලේඛන ප්‍රගුණ නොකොට ඇති සිංහල පාඨකයන්ට වටහා ගත හැකි පරිදි මහාචාර්ය හබර්මාස් මහතාගේ සන්නිවේදන සංකල්ප සරල ලෙස පහදා දීම මගේ අභිමතාර්ථයයි. The Theory of communicative Action (Volumes $I_2$ and $II_3$) moral consciousness And Communicative $Action_4$, The Structural Transformation of The Public $Sphere_5$ වැනි ග්‍රන්ථවලින් ඔහු සිය සන්නිවේදන සංකල්ප පැහැදිලි කළේය. සන්නිවේදන විද්‍යාව ගැඹුරු ලෙස උද්ග්‍රහණය කිරීමට රිසි විද්‍යාර්ථීන් මෙම ග්‍රන්ථ අවශ්‍යයෙන්ම පරිශීලනය කළ යුතුය.

මා ජර්ගන් හබර්මාස් විශිෂ්ට චින්තකයෙකු හා සන්නිවේදන විද්‍යාර්ථීන්ට මාර්ගෝපදේශකයෙකු වශයෙන් සලකන්නේ හේතු දහයක් නිසාය. පළමුවැන්න ඔහු මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා ඒකාබද්ධ කරමින් නව ගවේෂණ පථයක් හෙළි කිරීමට සමත් වීමයි. මානව ශාස්ත්‍ර විෂයන් අතුරින් දර්ශනය, ඉතිහාසය, භාෂා අධ්‍යයනය වැනි ක්ෂේත්‍රයන්ගෙන් ඔහු මහත් ආභාසයක් ලැබුවේය. සමාජ විද්‍යා විෂයන් අතුරින් සමාජ විද්‍යාව, මනෝ විද්‍යාව, නීති විද්‍යාව, දේශපාලන විද්‍යාව වැනි ක්ෂේත්‍ර කෙරෙහි ඔහු විශේෂ අභිරුචියක් දැක්වූවේය. මෙම විවිධ ක්ෂේත්‍ර කෙරෙහි ඔහු විශේෂ අභිරුචියක් දැක්වූවේය. මෙම විවිධ ක්ෂේත්‍ර හා සම්බන්ධ චින්තන රටා තමාට අභිමත පරිදි ඒකාබද්ධ කිරීමට, සම්මිශ්‍රණය කිරීමට ඔහු බොහෝ දුරට සමත් විය. හබර්මාස් මහතාගේ ශාස්ත්‍රීය පරිකල්පනය ශික්ෂණාන්තර පරිකල්පනයක් ලෙස හැඳින්විය හැකිය. මෙයින් මා අදහස් කරන්නේ ඒ ඒ අවස්ථාවට හා ගවේෂණ අභිලාෂයන්ට සරිලන පරිදි විවිධ අධ්‍යයන ක්ෂේත්‍රයන්ගෙන් ප්‍රභාවක් ලැබීමට ඔහු පසුබට නොවූ බවයි. හබර්මාස් සූරීන්ගේ මෙම ප්‍රයත්නය සන්නිවේදන විද්‍යාර්ථීන්ට වැදගත් වන්නේ සන්නිවේදන විද්‍යාව මානව ශාස්ත්‍රයන්ගේ හා සමාජ විද්‍යාවන්ගේ සුසංකලනයෙන් බිහිවූ ගවේෂණ මාර්ගයක් නිසාය.

හබර්මාස් මහතාණන්ගේ ශාස්ත්‍රීය කෘති මා උසස් කොට සලකන්නට පෙළඹවූ දෙවැනි හේතුව දර්ශන ශාස්ත්‍රය තුළ එඩිතර සංකලනයකට මඟ පෑදීමට ඔහු සමත්වීමයි. නවීන දාර්ශණිකයෝ දර්ශන ශාස්ත්‍රය මූලික ප්‍රවාහයන් දෙකකට බෙදා දක්වති. යුරෝපීය දර්ශන සම්ප්‍රදාය ඉන් එකකි. එය විවරණයට මුල් තැනක් දුන්නකි. අනෙක ඉංග්‍රීසි - ඇමරිකානු විශ්ලේෂණාත්මක දාර්ශනික සම්ප්‍රදායයි. එය විග්‍රහයට මුල් තැනක් දුන්නකි. මෙය දළ බෙදීමක් පමණි. බටහිර චින්තකයන් මෙතරම් පහසු ලෙස කොටස් දෙකකටවෙන්කොට දැක්විය නොහැකිය. මෙය ඉතා පුළුල් ව්‍යාප්ති ග්‍රහණයක් ලෙස සැලකීම වඩා මැනවයි සිතමි. කෙසේ නමුත් වර්තමාන දාර්ශනික භූමි තලය පිළිබඳ මෙබඳු අවබෝධයක් ඇති කර ගැනීමට මෙම විභේදනය ප්‍රයෝජනවත් වේ.

හේගල්, නිට්සේ, හයිඩෙගර් වැනි දාර්ශනියකයන් යුරෝපීය ප්‍රවාහයන්ට ඇතුලු කළ හැකි අතර රසල් ඊෆ් ග්‍රේට්, විට්ගන්ස්ටයින් වැනි දාර්ශනියන් ඉංග්‍රීසි- ඇමරිකානු ප්‍රවාහයට එක් කළ හැකිය. ජර්ගන් හබර්මාස්ගේ විශේෂත්වය නම් සිය ව්‍යාඛ්‍යානයන්හි දී ඔහු මෙම චින්තන සම්ප්‍රදායන් දෙකම ඒකාබද්ධ කිරීමය. ඔහු හේගල්ගේ මෙන්ම විට්ගන්ස්ටයින් හා ඔස්ටින්ගේ ලිපි ලේඛන වලින් ආභාසයක් ලැබීමට පසුබට නොවීමයි. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් හබර්මාස්ගේ නිබන්ධ මෙම දෙපක්ෂයටම අයත් චින්තනයන් තුළ ප්‍රබෝධයක් දැල්වීමට සමත් විය.

ජර්ගන් හබර්මාස්ගේ ලිපි ලේඛනවල මා දකින තෙවැනි වැදගත් ලක්ෂණය නම් සෛද්ධාන්තික පක්ෂය හා ප්‍රායෝගික පක්ෂය එකමුතු කිරීමයි. ඔහු සිද්ධාන්තවේදියෙකු වශයෙන් පතළ කීර්තියක් හිමි කොටගෙන ඇත. ඇමරිකාවේ විසූ අග්‍රගන්‍ය දාර්ශනිකයෙකු වූ රිචඩ් රෝර්ටි මහතා හබර්මාස් සූරීන් හැඳින්වූයේ වර්තමාන යුගයෙහි වෙසෙන ශ්‍රේෂ්ඨතම පද්ධති සිද්ධාන්තවේදියා ලෙසටයි. ඒ අතරම ගැඹුරු සමාජ විඥානයක් මෙහෙයවනු ලබන ප්‍රාඥයෙකු ලෙස ඔහු ප්‍රායෝගික පක්ෂය කෙරෙහි, දාර්ශනික චින්තන පථ සමාජ ප්‍රගමනය සඳහා උපයෝගී වන ආකාරය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කළේය. හබර්මාස් විද්වතාගේ ශාස්ත්‍රීය නිබන්ධවල දක්නට ලැබෙන සෛද්ධාන්තික හා පාරිභාරික අංශවල සමවාය සම්බන්ධය ඔහුගේ විශේෂත්වය මතු කොට දක්වන තවත් ලක්ෂණයකි. ජර්ගන් හබර්මාස් ෆ්‍රැන්ක්ෆර්ට් ගුරු කුලයට අයත් විය. මෙම ක්‍රියා මාර්ගය එම විද්වත් පර්ෂදය විසින් අනු දක්නා ලද එකකි.

ජර්ගන් හබර්මාස්ගේ ශාස්ත්‍රීය නිබන්ධවල මා අගය කරන සතරවැනි ප්‍රශස්ත ලක්ෂණය නම් ඒවා පුරා ගැඹුරු ප්‍රජාතන්ත්‍රවාදී විඥානයක් පැතිර තිබීමයි. ඔහුගේ ගවේෂණ මෙහෙයවනු ලැබුවේ ප්‍රජාතන්ත්‍රවාදී අපේක්ෂා මඟිනි. ඔහු සිය ප්‍රථම කෘතිය වන The Structural Transformation of the Public Sphere නමැති ග්‍රන්ථයෙන් ස්වාධීන චින්තනයට, නිදහසේ අදහස් හුවමාරුවට, මහජන මත නිෂ්පාදනයට තෝතැන්නක් වූ මහජන කක්ෂය බිහි වූ අයුරු ඓතිහාසික පදනමක පිහිටා විවරණය කළේය. මෙම කෘතියෙහි වැදගත්කම රඳා පවතින්නේ ප්‍රජාතන්ත්‍රවාදී චින්තන මාර්ග හා චර්යා රටා බටහිර රටවල උද්භවය ලැබූ අයුරු පෙන්නුම් කොට ඇති ආකාරය මතය. ඔහු විසින් පසු කාලයේ දී රචනා කරන ලද ග්‍රන්ථවල සන්නිවේදනයෙහි ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිෂ්ඨා හා යාන්ත්‍රණ මැනවින් විශ්ලේෂිතව ඇත. උදාහරණයක් වශයෙන් ඔහුගේ සම්භාව්‍ය ග්‍රන්ථයක් වන කාණ්ඩ දෙකකින් සමන්විත The Theory of Communicative Action යන කෘතිය සන්නිවේදනය සතු ප්‍රජාතන්ත්‍රවාදී පදනම විශද කිරිම සඳහා වෙන්ව ඇත. Moral Consciousness And Communicative Action, Facts And Norms වැනි ග්‍රන්ථවලින් මෙම ශාස්ත්‍රීය අභිලාෂ තව දුරටත් ඉදිරියට ගෙන ගොස් ඇත.

ජර්ගන් හබර්මාස් සූරින්ගේ ශාස්ත්‍රීය කෘතිවල විද්‍යාමාන පස්වැනි ආකර්ෂණීය ලක්ෂණය සිය පරීක්ෂණ විධි ගවේෂණ ක්‍රමෝපායන් ආත්මාවලෝකන අභිප්‍රායකින් යුතුව ගෙන හැර දැක්වීමයි. වෙනත් වචනවලින් පවසතොත් කිසියම් දාර්ශනික හෝ සමාජීක විශ්ලේෂණයක් සඳහා තමා උපයෝගී කොටගත් පර්යේෂණ මාර්ගයෙහි ස්වභාවය හා වැදගත්කම සිය පර්යේෂණ තුළින් විශද කිරීමට යත්න දරා තිබීමයි. මෙම ලක්ෂණය ද ෆ්‍රැන්ක්ෆර්ට් ගුරුකුලය විසින් අවධාරණය කරන ලද්දකි. මෙම ගුරුකුලය විචාරාත්මක න්‍යාය (Critical Theory) යන චින්තන දර්ශනය ව්‍යාප්ත කිරීමට පුරෝගාමී විය. හබර්මාස් විචාරාත්මක න්‍යායයෙන් මහත් ආභාසයක් ලැබුවේය. ඒ අතරම ස්වකීය දෘෂ්ටියෙන් හා ශාස්ත්‍රීය න්‍යාය ශාස්ත්‍රයෙන් කොටසක් එයට ඇතුළු කිරීමට සමත් වූයේය.

හබර්මාස්ගේ ශාස්ත්‍රීය ජීවිතය හා සම්බන්ධ සයවැනි වැදගත් ලක්ෂණය නම් ඔහු ගැඹුරු දාර්ශනික සංකල්පය සියුම් ලෙස විශ්ලේෂණය කළ චින්තකයෙකු වශයෙන් මෙන් ම ජන සමාජයෙහි උද්ගත වන විවිධ ප්‍රශ්න, ගැටලු හා අර්බුද පිළිබඳ සිය හැඟීම් හා අදහස් උදහස් නොපැකිලව දක්වන්නට නොබිය වූ ප්‍රාඥයෙකු ලෙසත් කීර්තියක් දිනා ගැනීමයි. ජර්මන් මෑත ඉතිහාසය හා සම්බන්ධ ප්‍රජාතන්ත්‍රවාදී විරෝධී ක්‍රියාදාම, නැගෙනහිර හා බටහිර ජර්මනිය ඒකාබද්ධ කිරීම, ආරක්ෂණාර්ථ ආගමිකයන් පිළිබඳ ගැටලු, යුදෙව් ජාතිකයන්ට එරෙහිව ගෙන යනු ලබන කුටෝපක්‍රම යනාදිය ඔහුගේ විචාරක්ෂයට යොමු විය. පුවත් පත් සඟරා මඟින් මෙම ප්‍රශ්න පිළිබඳ සිය හැඟීම් හා අදහස් උදහස් ඔහු වරින් වර ප්‍රකාශයට පත් කළේය. බෙහෝ දාර්ශනිකයෝ එක්ටැම් ගෙවල්වල සිරවී දවසරින්නට ප්‍රිය කරති. එහෙත් ජර්ගන් හබර්මාස් මහතා සමාජ විඥානයකින් හෙබි ප්‍රාඥයෙකු ලෙස සිය යුතුකම් ඉටු කිරීමට පසුබට නොවීය.

හබර්මාස් මහාචාර්යතුමාගේ විශේෂත්වයට හේතුභූත වූ සත්වැනි සාධකය වශයෙන් ඔහු නව්‍යත්වය හා පශ්චාත් නව්‍යත්වය පිළිබඳ ප්‍රකට කළ ආකල්පය දක්වනු කැමැත්තෙමි. ඔහුගේ බොහෝ විද්‍යාත්මක ලිපි ලේඛනවලට මුල් වූ තේමාවක් නම් නව්‍යත්වයෙහි ස්වරූපය හා එහි ශක්‍යතාව හා සීමාය. සන්නිවේදනය අරබයා හබර්මාස් ඉදිරිපත් කළ ව්‍යාඛ්‍යාවන් නව්‍යත්වය නමැති සංකල්පය සමඟ අවියෝජනීය ලෙස බැඳී පවතී. සිය සමකාලිකයන් වන ජැක් ඩෙරිඩා, මිචෙල් ෆූකෝ, ජෝන් බෝද්‍රියා, ජැක් ලේකාන්, රෝලන්ඩ් බාත් වැනි විද්වතුන් පශ්චාත් සංස්ථිකවාදය හා පශ්චාත් නව්‍යවාදය කෙරෙහි පක්ෂපාතීත්වයක් දැක්වූ අතර හබර්මාස් පශ්චාත් නව්‍යවාදයෙහි සීමාවන් හා ඌනතාවන් මතුකොට දැක්වූයේ ය. එය අතාර්තිකත්වයට මුල් තැනක් දෙන අනර්ථදායි චින්තන ක්‍රමයක් බව ඔහුගේ පිළිගැනීම විය.

බොහෝ සමකාලීන ප්‍රාඥයෝ හබර්මාස්ගේ මෙම ආකල්පය තියුණු දෝෂ දර්ශනයට ලක් කළහ. එහෙත් පශ්චාත් නව්‍යවාදය පිළිබඳව සිය දෘෂ්ටිය වෙනස් කිරීමට ඔහු නොපෙළඹිණ. නව්‍යත්වය නොනිම වූ ව්‍යාපෘතියක් බවත්, අපගේ අවධානය යොමුවිය යුත්තේ නව්‍යත්වය කෙරෙහි හා එයින් ලබාගත හැකි ඵල ප්‍රයෝජන කෙරෙහි බවත්, ඔහු අවධාරණයෙන් පළ කළේය. නව්‍යත්වය ගැන ඔහු දක්වා ඇති සියලු අදහස් මම ද අනුමත නොකරමි. එහෙත් පශ්චාත් නව්‍යවාදය හා සම්බන්ධ ඇතැම් ඌනතාවන් හා සංශයජනක ධර්මතා මතුකොට දැක්වීමෙන් ජර්ගන් හබර්මාස් සූරීන් ඉටු කළේ වැදගත් ශාස්ත්‍රීය සේවාවක් යැයි සිතමි.

ජර්ගන් හබර්මාස්ගේ විශේෂත්වය සලකුණු කරන අටවැනි වැදගත් හේතුව නම් මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා ගවේෂණයන්හි දී මානව විඥානය වෙනුවට භාෂාව හා සන්නිවේදන ක්‍රියාවලිය කෙරෙහි විද්‍යාර්ථීන්ගේ අවධානය යොමු කරවීමයි. නව්‍යත්වය විග්‍රහ කිරීමට ප්‍රයත්න දරූ බොහෝ දාර්ශණිකයන් හා සමාජ විද්‍යාඥයන් මානව විඥානයට ප්‍රමුඛ ස්ථානයක් දීමට වෑයම් කළ බව කිවයුතු ය. සංදෘෂ්ටිකවාදී චින්තනයෙහි මෙන්ම නවීකරණය විග්‍රහ කිරීම සඳහා ප්‍රයත්න දරන සමාජ විද්‍යාත්මක ලේඛනවල ද මෙම ලක්ෂණය දක්නට ලැබේ. මානව විඥානය සත්තාවක් වශයෙන්, ප්‍රපංචයක් වශයෙන් නොවැදගත්යැයි මම නොපවසමි. එහෙත් භාෂාව හා සන්නිවේදනය ඒ තරමට වැදගත්ය. මෙම අර්ථවත් සත්‍ය බුද්ධිමත් පාඨකයාට ඒත්තු යන පරිදි නිරූපණය කිරීමට හබර්මාස් සමත් විය. විශේෂයෙන්ම, සන්නිවේදන ක්‍රියාවලිය පිළිබඳ ඔහු විසින් ඉදිරිපත් කරන ලද විවරණ මගින් මෙම කරුණ මැනවින් තහවුරු විය.

මගේ පිළිගැනීමට අනුව ජර්ගන් හබර්මාස්ගේ සම්භාව්‍යත්වයට තුඩු දුන් නවවැනි වැදගත් හේතුව මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යාත්මක ගවේෂණයන්හි දී සන්නිවේදනයට මුල් තැනක් දීමයි. වෙන කිසිදු නවීන දාර්ශනිකයෙක් හබර්මාස් තරම් සිය විවරණ ව්‍යාපෘතිවල සන්නිවේදනයට මුඛ්‍ය ස්ථානයක් දී නොමැත. සන්නිවේදන විද්‍යාර්ථීන් වශයෙන් මෙය අපගේ සුවිශේෂ සැලකිල්ලට යොමු විය යුතු කරුණකි. බොහෝ දාර්ශනිකයෝ, චින්තකයෝ, සමාජ විද්‍යාත්මක පර්යේෂකයෝ, සන්නිවේදනයෙහි වැදගත්කම දුටහ. එහෙත් ඔවුහු මෙම සංකල්පය සිය පර්යේෂණ කාර්යයන්හි කේන්ද්‍රීය සංකල්පය ලෙස නොසැලකූහ. හබර්මාස්ගේ විශේෂත්වය නම් සන්නිවේදනය සිය ගවේෂණවල මුඛ්‍යතම සංකල්පය බවට පත් කිරීමයි. මෙය ශාස්ත්‍රීය ලේඛනයෙහි අර්ථවත් අභිවර්ධනයක් ලෙස හඳුන්වනු කැමැත්තෙමි.

හබර්මාස්ගේ සම්භාව්‍යත්වයට පාදක වූ දසවැනි සාධකය වශයෙන් සන්නිවේදන ක්‍රියා හා සත්‍යය අතර පවත්නා සම්බන්ධය දාර්ශනික පදනමක පිහිටා විශ්ලේෂණය කිරීමට දරා ඇති පරිශ්‍රමයයි. මානව සමාජයෙහි යහ පැවැත්මටසන්නිවේදනය මූලික වන අයුරුත්, ශාස්ත්‍රීය ගවේෂණ වල දී සන්නිවේදනය මුඛ්‍යතම සංකල්පය විය යුතු අයුරුත් හබර්මාස් මැනවින් පෙන්නුම් කළේය. එමතු ද නොව සන්නිවේදනය හා සත්‍යය අතර පවත්නා සම්බන්ධයත් සත්‍යය තහවුරු කරගැනීම සඳහා සන්නිවේදනය වහල් කොට ගත හැකි ආකාරය දාර්ශනික චින්තා හා තර්කය ඇසුරෙන් විශද කිරීමට හබර්මාස් සමත් විය. අන් කිසිදු දාර්ශනිකයෙකුට මෙම අභිමත කාර්යය ඉටු කර ගත නොහැකි විය. සන්නිවේදන විද්‍යාඥයන්ගේ විශේෂ ගෞරවය දිනා ගැනීමට හබර්මාස් පඬිතුමාට හැකි වූයේ මෙම හේතුව නිසාය.

ශාස්ත්‍රඥයෙකු වශයෙන් ජර්ගන් හබර්මාස් මහතාගේ විශේෂත්වයට හේතුභූත වූ සාධක දහයක් මම දක්වූයෙමි. මේවා සියල්ලම සන්නිවේදනය සමඟ බැඳී ඇත. එමෙන් ම සන්නිවේදනයෙහි වැදගත්කම තහවුරු කරයි.

මා විසින් මෙතෙක් දක්වන ලද චින්තන සමඟ පසුබිම් කොට ගෙන සන්නිවේදනය පිළිබඳ හබර්මාස් ඉදිරිපත් කොට ඇති ආකෘතිය සැකෙවින් හඳුන්වා දෙනු කැමැත්තෙමි. හබර්මාස් විසින් රචනා කරන ලද සියලු ශාස්ත්‍රිය නිබන්ධ හදාරා ඒවායින් ගම්‍යමාන වන සන්නිවේදන ආකෘතිය සිංහල පාඨකයාගේ සුඛාවබෝධයට සරිලන පරිදි සරල ලෙසගෙනහැර දක්වීම මගේ අභිප්‍රායයි.

මගේ වැටහීමට අනුව හබර්මාස්ගේ සන්නිවේදන ආකෘතියෙහි අංශ දෙකක් ඇත. එක් අංශයක් ව්‍යවහාරෝචිත ක්‍රියා මාර්ගයක් නියෝජනය කරයි. අනෙක් අංශය සාංකල්පික ක්‍රියා මාර්ගයත් නියෝජනය කරයි, මෙම අංශ දෙක අතර දෘඪ සමවාය සම්බන්ධයක් ඇත. එක් අංශයක් අනෙක් අංශය පෝෂණය කරයි. අපි පළමුවෙන් ව්‍යවහාරික අංශය සලකා බලමු. ඔහු වර්ෂ 1962 දි ජර්මන් භාෂාවෙන් THE STRUCTRURAL TRANSFORMATION OF THE PUBLIC SPHERE නමැති ග්‍රන්ථය පළ කළේය. මෙය ඉංග්‍රිසියට පරිවර්තනය කරන ලද්දේ වර්ෂ 1989 දීය. හබර්මාස්ගේ සන්නිවේදන චින්තනය නිසි ලෙස වටහා ගැනීමට මෙම ග්‍රන්ථය මහෝපකාරී වේ. මෙම ග්‍රන්ථයට මුල් වී ඇත්තේ මහජන කක්ෂය (PUBLIC SPHERE) නැමැති සංකල්පයයි.

මහජන ජීවිතයෙහි ස්වරූපය හා මහජන මතය ගොඩනැගෙන අයුරු වැනි තේමාවන් මෙම කෘතියෙන් විශ්ලේෂිතව ඇත. මහජන කක්ෂය යන සංකල්පයෙන් ඔහු හඳුන්වා දෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදී සමාජවල රජයත්, වෙළඳ පොළත්, පුද්ගල ජීවිතයත් අතර ඇති අවකාශයටයි. මෙම

අවකාශය තුළ නිදහස් පුරවැසියන් වශයෙන් විවිධ විෂයන් විවෘත ලෙස සාකච්ඡා කිරීමට අවස්ථාවක් ඇත. මෙය ප්‍රජාතන්ත්‍රවාදී සමාජ හා සම්බන්ධ අපරිහාර්ය අංගයකි. මෙම මහජන කක්ෂය යුරෝපියෙහි පහළ වූ ආකාරයත් එහි පැවැත්මට අත්‍යවශ්‍ය සන්නිවේදන මූලධර්ම පහදා දීමත් හබර්මාස්ගේ අරමුණයි.

හබර්මාස් මහතා අවධාරණය කරන්නේ දහහත්වැනි සියවසෙහි අපරාර්ධයෙහි යුරෝපීය රටවල සම්භවය ලද මහජන කක්ෂය ප්‍රජාතන්ත්‍රවාදීපැවැත්මට අත්‍යවශ්‍ය වූ සංස්ථාවක් බවයි. මුල දී එංගලන්තයෙහි උපත ලද මහජන කක්ෂය පසුව ප්‍රංශය, ජර්මනිය, ඉතාලිය වැනි රටවල ව්‍යාප්ත විය. පුවත්පත්, සඟරා, සාකච්ඡා මණ්ඩප යනාදිය නිසා නිදහස් ලෙස රජයත් සමාජ සංස්ථාත් විවේචනයට ලක් කිරීමට හා ප්‍රබුද්ධ මහජන මතයක් පතළ කිරීමට සුදුසු සමාජපරිස්ථිතියක් බිහිවිය. මහජන කක්ෂය එම ප්‍රවණතාවන් හසුරුවන බලවේගයක් මෙන්ම ඒවයෙහි ඵලයක් ලෙසද හඳුන්වනු කැමැත්තෙමි.

මා විසින් මීට ඉහත දී සඳහන් කරන ලද මහජන කක්ෂය වූ කලී හබර්මාස්ගේ සන්නිවේදන ආකෘතියෙහි ව්‍යවහාරෝචිත අංශයයි. මෙම මහජන කක්ෂයෙහි ක්‍රියාකාරීත්වයට යටින් දිවෙන මූලධර්ම, චින්තන රටා හා ධර්මතා එහි න්‍යායාත්මක අංශයයි.ඔහු මහජන කක්ෂයනම් වූ සංකල්පයෙන් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයන්හි පුරවැසියන් මුණ ගැසී ස්වාධීන ලෙස ප්‍රශ්න හා ගැටලු සාකච්ඡා කොට යම් යම් සම්මුතිවලට එළඹෙන අයුරු විදහා දැක්වීමට තැත් කළේය. ඊට අනතුරුව ඔහු සම්පාදනය කළ නිබන්ධ තුළින් මහජන කක්ෂයෙහි ක්‍රියාකාරීත්වයට ජීව බලය සපයන සන්නිවේදන ධර්මතා හා යාන්ත්‍රණ පැහැදිලි කිරීමට යත්න දැරුවේය. මෙම ප්‍රයත්නයේ දී සන්නිවේදන ක්‍රියා (Communicative Action) සන්නිවේදන තාර්කිකත්වය (COMMUNICATIVE RATIONALITY) සංකථන ආචාරධර්ම (DISCOURSE ETHICS) වැනි උපසංකල්ප ඔහු සාර්ථක ලෙස උපයෝගී කර ගත්තේය. මේවාටම සම්බන්ධ වූ උපසංකල්ප ලෙස සන්නිවේදන නිපුණත්වය (COMMUNICATIVE COMPETENCE) සර්වව්‍යාපී ප්‍රායෝගිකත්වය (UNIVERSAL PRAGMATICS) අභීෂ්ට භාෂණ අවස්ථා (IDEAL SPEECH SITUATION) යන මනෝගත ද ඔහු විසින් භාවිත කරන ලදී.

ජර්ගන් හබර්මාස්ගේ චින්තන මාර්ගයෙහි යථා ස්වරූපය වටහාගනු පිණිස සන්නිවේදන තාර්කිකත්වය යන සංකල්පය විමසා බලමු. මෙම සංකල්පය උපයෝගි කර ගැනීමෙන් හබර්මාස් සූරීන් වැයම් කළේ මානව තාර්කිකත්වය හා සන්නිවේදනය අතර පවත්නා දැඩි සම්බන්ධතාව අනාවරණය කිරීමයි. ජර්ගන් හබර්මාස්, කාල් ඔටෝ ඒයල් වැනි ජර්මන් ජාතිකයන් විසින් සර්වව්‍යාපී ප්‍රායෝගිකත්වය යනුවෙන් හඳුන්වා දෙන ලද්දේ මෙම ප්‍රපංචයෙහි තවත් අංශයකි. සංකථන ආචාර්යධර්ම ඎ තාර්කික ප්‍රතිනිර්මාණය වැනි සංකල්ප ද මේ සමඟ බැඳී ඇත. ජන සමාජයෙහි වෙසෙන පුරවැසියන් විවිධ ප්‍රශ්න, ගැටලු පිළිබඳව පොදු සම්මුතියකට, පොදු එකගත්වයකට එළඹීම සඳහා සන්නිවේදනය වහල් කොට ගත හැකි ආකාරය විශද කිරීම සන්නිවේදන තාර්කිකත්වයෙහි අභිමතාර්ථයයි.

ජර්ගන් හබර්මාස් කියා සිටින්නේ මෙම සන්නිවේදන තාර්කිකත්වය සන්නිවේදන ක්‍රියාදාමයෙහිම අන්තර්ගතව ඇති බවයි. විවිධ ගැටලු, ප්‍රශ්න පිළිබඳ පොදු සම්මුතියකට එළඹීමට අනුබල දෙන සන්නිවේදන ක්‍රියාදාමයන් පුරවැසියන් වටහා ගන්නේ නිතැතිනි; අන්තර් ඥානයෙනි. එය බුද්ධිමත් ලෙස, ශාස්ත්‍රීය පදනමක පිහිටා විවරණය කිරීම සන්නිවේදන විද්‍යාඥයන් සතු කාර්යභාරය බව හබර්මාස් සූරීහු පවසති. ඔහුගේ විභජනයට අනුව තාර්කිකත්වය යන සංකල්පය ප්‍රධාන කොටස් දෙකකට බෙදා වෙන් කල හැකිය. එම කොටස් දෙක නම් උපකරණාත්මක තාර්කිකත්වය (INSTRUMENTALRATIONALITY) හා සන්නිවේදන තාර්කිකත්වයයි. (COMMUNICATIVE RATIONALITY) උපකරණාත්මක සන්නිවේදනයේ දී සිදු වන්නේ සන්නිවේදනය හුදු උපකරණයක් බවට පත්වීමයි. ප්‍රචාරණ කටයුතු වලදී ස්වකීය ලාභ ප්‍රයෝජන සඳහා සන්නිවේදනය වහල් කොට ගන්නා විට ක්‍රියාත්මක වන්නේ උපකරණාත්මක තාර්කිකත්වයයි. අනෙක් අතට එකිනෙකාගේ අදහස් උදහස් හා මති මතාන්තර වලට ගරු කරමින් පොදු එකඟත්වයක් උදාකර ගැනීම සඳහා සන්නිවේදනය උපයෝගී කර ගන්නා විට ක්‍රියාත්මක වන්නේ සන්නිවේදන තාර්කිකත්වයයි. මෙහිදී සන්නිවේදනය හුදු උපකරණයක් වශයෙන් නොව ජීව දායක බලවේගයක්, අර්ථ නිෂ්පත්ති මාර්ගයක් වශයෙන් ක්‍රියා කරයි. හබර්මාස් පඩිවරයා අගය කරන්නේ මෙම

සන්නිවේදන තාර්කිකත්වයයි. ඔහුගේ මූළ සන්නිවේදන ආකෘතිය සම්පාදිතව ඇත්තේ සන්නිවේදන තාර්කිකත්වය මුල් කොට ගෙනය.

සමාජයෙහි පුරවැසියන් පොදු සම්මුති වලට එළඹීම සඳහා සන්නිවේදනය උපයෝගී කර ගන්නා අයුරු විශද කිරීම හබර්මාස්ගේ එක් අරමුණකි. අනෙක් අරමුණ සන්නිවේදනය හා සත්‍යය අතර පවත්නා සම්බන්ධය පැහැදිලි කිරීමය. සත්‍ය කරා ළඟා වීමට සන්නිවේදනය උපකාරී වන අයුරු දාර්ශනික පදනමක පිහිටා විශ්ලේෂණය කිරීමය. මේ සඳහා භාෂාව, සන්නිවේදනය හා තාර්කිකත්වය අතර පවත්නා සම්බන්ධය ඔහු සියුම් විග්‍රහයකට ලක් කරයි. මෙහිලා ඔහු සප්‍රමාණතා අභ්‍යර්ථනා (VALIDITY CLAIMS) යන චින්තාව උපයෝගී කොට ගෙන ඇත.

හබර්මාස්ගේ පිළිගැනීමට අනුව කිසියම් පුද්ගලයකු තවත් පුද්ගලයෙකුට යමක් පවසන විට එම දෙවැනි පුද්ගලයා මතු දැක්වෙන සප්‍රමාණතා සිත්හි තබාගෙන සිටී. මෙම සප්‍රමාණතා අභ්‍යර්ථනා මුඛ්‍ය වශයෙන් වර්ග සතරකට ඔහු බෙදා දක්වයි. එම වර්ග සතර නම්,

1. පවසන ලබන ප්‍රකාශනය අර්ථවත් වීම. වෙනත් වචනවලින් පවසතොත් එය සම්මත ව්‍යාකරණ රීතීන්ට හා වාක්‍ය රටා වලට අනුගත වීමත් අසන්නාට වටහා ගත හැකි අර්ථයක් එහි ගැබ්වී තිබීමත්ය.
2. පවසන ලබනු දෙය සත්‍යාන්විත වීමයි. එනම් එය පිළිගත හැක්කක් වීමය.
3. සන්නිවේදකයාගේ ප්‍රකාශනය යුක්ති යුක්ත වීමය. එනම් එම භාෂණය ක්‍රියාත්මක වන සමාජය පරිස්ථිතියෙහි පිළිගැනීම් වලට අනුව එම ප්‍රකාශය කිරීමට සන්නිවේදකයාට අයිතියක් තිබීම.
4. සන්නිවේදකයාගේ අවංක භාවය. එනම් ඔහු සිය ප්‍රකාශය කරන්නේ අසන්නා රැවටීමේ හෝ නොමග යැවීමේ හෝ චේතනාවෙන් නොවන බව තහවුරු කිරීමය.

මෙම සප්‍රමාණතා අභ්‍යර්ථනා දාර්ශනික ප්‍රතිෂ්ඨාවක පිහිටා විශ්ලේෂණය කිරීමට හබර්මාස් පඩිවරයා යත්න දරා ඇත. මේ ආකාරයට විස්තර කරන විට හබර්මාස්ගේ විශ්ලේෂණය අතිශයින්ම අමූර්ත එකක් ලෙස පෙනෙන්නට ඉඩ ඇත. එහෙත් එය දෛනික ජීවිතයේ දී විවිධ පරිමිති හා සම්බන්ධ කොට පැහැදිලි කිරීමට ඔහු දැඩි උත්සාහයක් දරා තිබේ.

ජර්ගන් හබර්මාස්ගේ අභිප්‍රාය නිර්බාධ සන්නිවේදන ක්‍රියාදාමයක ස්වරූපය පැහැදිලි කිරීමය. ඔහු මෙය හඳුන්වා දුන්නේ අවිකෘත සන්නිවේදනය (UNDISTORTED COMMUNICATION) යනුවෙනි. මෙම අවිකෘත සන්නිවේදනයට අනුව සන්නිවේදකයා හා ශ්‍රාවකයා ඉහත සඳහන් කරන ලද සප්‍රමාණතා අභ්‍යර්ථනා සතර තහවුරු කරති. මෙම සප්‍රමාණතා අභ්‍යර්ථනා සතර අර්ථාන්විත භාවය සත්‍යගරුකත්වය, යුක්ති යුක්ත භාවය හා අවංකත්වය යන තේමා සමඟ බැඳී තිබේ.

මහාචාර්ය ජර්ගන් හබර්මාස් මහතා දර්ශනය හා සන්නිවේදනය අතර පවත්නා සම්බන්ධය තම දෘෂ්ටි කෝණයකින් අවලෝකනය කිරීමට මඟ පෑදුවේය. ඩේකාට්ගේ පටන් බටහිර දාර්ශනිකයෝ පුද්ගලයා - පුද්ගල විඥානය - අන්‍යයන් අවනත කරගැනීම සඳහා සන්නිවේදනය උපයෝගී කර ගැනීම කෙරෙහි සිය අවධානය යොමු කළහ. හබර්මාස් පුද්ගලාන්තර සම්බන්ධය - භාෂාව - සෙස්සන් සමග පොදු එකඟත්වයකට එළඹීම සඳහා සන්නිවේදනය උපයෝගී කර ගැනීම කෙරෙහි සිය අවධානය යොමු කළේය. හබර්මාස් මෙන් සන්නිවේදනය ස්වකීය දර්ශනයෙහි මූලස්ථම්භය කළ වෙනත් බටහිර දාර්ශනිකයෙක් නොමැත. එබැවින් සන්නිවේදන විද්‍යාර්ථීන් වශයෙන් අප හබර්මාස්ගේ සන්නිවේදන චින්තන මාර්ගය ලැදිව ප්‍රගුණ කළ යුතුය. එම කාර්යය සාධනය සඳහා මුල් පියවරක් වශයෙන් හබර්මාස්ගේ සන්නිවේදන චින්තනය සැකෙවින් පැහැදිලි කිරීමට මම අදහස් කළෙමි.

හබර්මාස්ගේ සන්නිවේදන ආකෘතිය සර්වෝතෝභද්‍ර නොවේ. එහි නොයෙක් ඌනතා හා අඩුපාඩුකම් ඇත. උදාහරණයක් වශයෙන් මහජන කක්ෂය යන සංකල්පය ගැන බලමු. මහජන කක්ෂය සාර්ථකව ක්‍රියාත්මක වූ අවධියක් ලෙස හබර්මාස් මහතා 18 වැනි සියවස දක්වයි. එහෙත් එම අවධියේදී කාන්තාවන්ට හා සුළු ජාතීන්ට ස්වාධීන ලෙස මහජන කක්ෂයට සහභාගී වීමට නොහැකි වූ බව ඔහු අමතක කරයි. හබර්මාස්ගේ මහජන කක්ෂය නැමැති සංකල්පය හා සම්බන්ධ

ඇතැම් ඌනතා SINHALA NOVEL AND THE PUBLIC SPHERE, නමැති මගේ ග්‍රන්ථයෙහි මම පැහැදිලි කළෙමි.

එමෙන්ම සන්නිවේදන තාර්කිකත්වය නමැති සංකල්පය හා සම්බන්ධ ඇතැම් දුර්වලතා දක්විය හැකිය. මෙහිදී හබර්මාස් පෙන්නුම් කරන්නේ අභිෂ්ට තත්ත්වයකි. තර්කය, බුද්ධිය, අන්‍යෝන්‍ය අවබෝධය පාදක කොටගත් සන්නිවේදන ක්‍රියාවලියක් තුළින් පොදු එකඟත්වයකට එළඹිය හැකි බවය. එහෙත් අනිසි බලපෑම්, මත සංඝට්ටන බල විෂමතා යනාදිය පුද්ගලාන්තර සන්නිවේදන ක්‍රියාදාමයන්ගෙන් වෙන් කිරීම පහසු නොවේ. තර්කයෙන්, බුද්ධියෙන්, අන්‍යෝන්‍ය අවබෝධයෙන්, සංඝට්ටන වලින් තොරව සම්මුතීන්ට එළඹීම තරමක් දුෂ්කරය. මෙම අංශය කෙරෙහි හබර්මාස් ප්‍රමාණවත් ලෙස සිය අවධානය යොමු නොකල බව මගේ විශ්වාසයයි. මෙබඳු ඌනතාවන් ඇතත් හබර්මාස්ගේ සන්නිවේදන ආකෘතිය අප ලැදිව හැදෑරිය යුතුය. අපගේ සන්නිවේදන චින්තනය නව මාර්ග ඔස්සේ ගමන් කරවීමට එය අර්ථවත් උත්තේජනයක් වනු ඇත. කැලණිය විශ්වවිද්‍යාලයෙහි ජනසන්නිවේදන අධ්‍යයන අංශයට සතළිස් වසරක් පිරීම සමරන මෙම අවස්ථාවේ දී, සන්නිවේදන විද්‍යාත්මක නිම් වළලු පුළුල් කිරීමට කැප වූ අධ්‍යයන අංශයක් වශයෙන් හබර්මාස්ගේ සන්නිවේදන චින්තන මාර්ගය කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් යැයි සිතමි.

**සටහන්**


1. JURGEN HABERMAS - COMMUNICATION AND THE EVALUTION OF SOCIETY (1979)
2. JURGEN HABERMAS - THE THEORY OF COMMUNICATIVE ACTION.VOL.(1984)
3. JURGEN HABERMAS - THE THEORY OF COMMUNICATIVE ACTION. VOL 2 (1987)
4. JURGEN HABERMAS - MORAL CONSCIOUSNESS AND COMMUNICATIVE ACTION (1990)
5. JURGEN HABERMAS - THE STRUCTURAL TRANSFORMATION OF THE PUBLIC SPHERE (1989)
6. JURGEN HABERMAS - BETWEEN FACTS AND NORMS (1996)
7. WIMAL DISSANAYAKE - SINHALA NOVEL AND THE PUBLIC SPHERE (2009)